# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## උඩරට නර්තන කලා සිද්ධාන්ත - DKAD 21072

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න හතකින් (07) සමන්විත ය.
❖ එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් (01) හෝ තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ. (එක් පිළිතුරුක් සඳහා ලකුණු 20 ක් හිමිවේ)

---

### I - කොටස

01. "තාලය" යන්න හඳුන්වා, උඩරට නර්තන සම්ප්‍රදායේ භාවිත තාල පද්ධති පිළිබඳ සාකච්ඡා කරන්න.

02. දේශීය වන්නම් වූ කලී උඩරට නර්තනයේ ව්‍යවහාරික කලාංගයකි. වන්නම ප්‍රභවයේ සිට 21 වන සියවස තෙක් එහි ව්‍යාප්තියේ සුවිශේෂතා උදහරණ මගින් පෙන්වා දෙන්න.

03. "කොහොඹා යක් කංකාරිය වූ කලී ක්‍රි.ව. 14 වැනි සියවසෙන් පසු එක් එක් කාල වකවානුවල දී විවිධ නර්තන හා ගායන අංග එක්වීමෙන් සම්පූර්ණ වූ සමාජ මානව විද්‍යාත්මක වටිනාකමින් යුත් ශාන්තිකර්මයකි." විමසන්න.

04. උඩරට සම්ප්‍රදායට අයත් පාරම්පරික ගුරුකුල හඳුන්වා, ප්‍රචලිත ශාන්තිකර්ම ආශ්‍රිත ප්‍රාදේශීය හා ගුරුකුල විශේෂතා විස්තර කරන්න.

### II - කොටස

05. ශ්‍රී ලංකාවේ කඩවර ඇදහිලි හා විශ්වාස හඳුන්වා, ඔබ උගත් කඩවර කංකාරියක ගුරුකුල විශේෂතා විස්තරාත්මකව විමසන්න.

06. උඩරට නර්තන සම්ප්‍රදායේ නර්තනයට භාවිත උඩැක්කිය සහ ගැටබෙරයේ විශේෂතා පහතා දැක්වෙන කරුණු ඇසුරෙන් සන්සන්දනාත්මකව සාකච්ඡා කරන්න.

    i. වාදන විශේෂතා
    ii. ව්‍යුහාත්මක ලක්ෂණ
    iii. භාවිතයේ විශේෂතා

*හෝ*

උඩැක්කි නර්තනය හා සබැඳි ඓතිහාසික තොරතුරු, සාහිත්‍යමය මූලාශ්‍රය හා ජනශ්‍රැති මගින් එහි ඉපැරණි බව සනාථ කරමින් විමසුමට ලක්කරන්න.

අ.පි.බ

07. සතර කෝරළයේ ගම්මඩුවක දී රඟ මඬලෙහි සකසනු ලබන සැරසිලි රාශියක් වේ.

i. එහි එන සැරසිලි දහයක් නම් කරන්න.
ii. සැරසිලි හතරක් භාවිතයට ගන්නා අවස්ථා පැහැදිලි කරන්න.

***හෝ***

සතර කෝරළ ගම්මඩුවක දී ඉදිරිපත් කෙරෙන පහත දැක්වෙන නාට්‍යමය අවස්ථා අතුරින් හතරක් තෝරාගෙන විස්තර කරන්න.

i. අඹ ආභරණ වැඩම වීම
ii. සළඹ සෙත් කිරීම
iii. පත්තිනි උපත
iv. පතස් කැපීම සහ අඹ විදමන
v. වේසා මැඩීම
vi. පාළඟ කුමරු මැරීම

......................

**2023.02.03**